# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/31 - 2013 ජනවාරි මස 30 වැනි බදාදා - 2013.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමයන්

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස් දෙල්කඳ පොළ සංවර්ධන කටයුතු සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, අදාළ ඉඩම් කොටස් එකී කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526 ඩී ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගංගොඩවිල ගමේ පිහිටි, බලයලත් ලියාපදිංචි මිනින්දෝරු අයි. ටී. මාදොල මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 2012/155 හා 2012.12.07 වැනි දින දරන සැළසුමේ පෙන්නුම් කෙරෙන අක්. 01, රූඩ් 03, පර්. 29.51 ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම්.

| | | |
|---|---|---|
| *උතුරට* | : | නිවාස සඳහා යන පාර ; |
| *නැගෙනහිරට* | : | පරණ කැස්බෑව පාර ; |
| *දකුණට* | : | ඒ දයානන්ද හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | පාර සහ රාජපක්ෂ, වී. එස්. පෙරේරා, වයි. සිසිර කුමාර හා පී. මුණසිංහ යන අය හිමිකම් කියන ඉඩම්. |

02 - 458

1A - G 017216 — 340 (2013/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.